**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් - 2021**

-----------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් ඇතුළත් සමූහයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් ඇතුළත් සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව සාධාරණ වටිනාකම සැලකිය යුතු තරම් වෙනස්වන හා ඉක්මනින් වෙනස්වීම්වලින් යුක්ත වන වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම්ගත කළ යුතු වුවත්, අධිකාරිය විසින් 1984-1989 කාලයේදී මිලදීගෙන තිබුණු පිරිවැය රු.64,320,853 ක් වූ ඉඩම් කට්ටි 02 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණු අතර ඒවායේ පිරිවැය හෝ ගිණුම්ගත කර නොතිබුණි. එසේම අධිකාරිය විසින් සිය කලාප කාර්යාල, අංශයන්, නිල නිවාස සහ සංචාරක බංගලා ආදිය පිහිටි ඉඩම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ඉඩම් කට්ටි දෙකෙහි වර්තමාන වෙළඳපල වටිනාකම තක්සේරු කිරීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2016 වර්ෂයේ ලබා දී ඇති අතර ඒ පිළිබඳව සිහිකැඳවීම් කළද, මෙතෙක් අදාළ තක්සේරු වාර්තා ලැබී නොමැත. අධිකාරියෙහි කලාප කාර්යාල, අංශයන්,නිල නිවාස සහ සංචාරක බංගලා ආදිය පිහිටි ඉඩම්, රජයේ ඉඩම් වන අතර මෙහි පරම අයිතිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු නොවන අතර එහි පරිපාලනය පමණක් අධිකාරිය සතු බැවින් මෙම වත්කම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොමැති බව දන්වා සිටිමි. | අධිකාරිය සතු වත්කම් ගිණුම්ගත කළයුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන්, රු.671,503,748 ක මොරගහකන්ද ව්‍යාපෘතියෙන්, රු.430,418,733 ක දේශගුණ අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියෙන්, රු.325,457,540 ක වත්කම් අධිකාරිය වෙත ලැබී තිබුණ ද සමාලෝචිත වර්ෂය වනවිට පිලිවෙලින් රු.537,950,118 ක, රු.225,822,896 ක හා රු.186,391,238 ක වත්කම් පමණක් ගිණුම්ගතකර තිබුණි. තවද මොරගහකන්ද ව්‍යාපෘතියෙන් ලබාගත් වාර්තා අනුව අධිකාරිය වෙත පවරන ලද වත්කම්වල අගය රු.586,015,546 ක් විය. එසේ වුවත් මෙකී වෙනස්කම් පිළිබඳ පරීක්ෂා කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති විසින් කලාප/ අංශවල කාර්යාල වෙත සෘජුවම වත්කම් ලබාදීම හා එසේ ලබා දීමේ දී ඒකීය ක්‍රමවේදයක් අනුගමනය නොකිරිම.<br><br>ව්‍යාපෘති වලින් කලාප/අංශවල කාර්යාල වෙත සෘජුවම ලබා දී තිබූ වත්කම් ගිණුම්ගත කිරිම සඳහා විස්තර සොයාගනු ලද්දේ 2021 වර්ෂයේදීය. මෙසේ ගිණුම්ගත කිරිම් සඳහා ඉදිරිපත් කළ වත්කම් ලේඛණවල ඇතුළත් භාණ්ඩ, භෞතිකව හඳුනාගත නොහැකිවීම නිසා ගිණුම් ගතකර නොමැති වීම.<br>කෙසේ වෙතත් ව්‍යාපෘතිවලින් ලබාදුන් වත්කම්වල නිවැරදි තොරතුරු සොයා බලා එම තොරතුරු පරිගණක ගතකිරීමේ කටයුතු මේ වනවිට සිදුවෙමින් පවතින අතර එම තොරතුරු පදනම් කරගෙන 2022 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම් විධිමත් පරිදි භාරගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |
| (ආ) | ඇඹිලිපිටිය කලාපයේ වාණිජ ඉඩම් බදුදීම් ආදායම වූ රු.2,688,000 ක් ආදායම් ලෙස සටහන් නොකර වෙළඳ ණයහිමියෝ ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජ'නල් සටහනක් මගින් නිවැරදි කිරිමට කටයුතු කරමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළයුතුය. |
| (ඇ) | මුරවැසිහේන යෝජිත කාර්යාලය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළව රු.478,496 ක වැට් හා රු.1,446,980 ක අමුද්‍රව්‍ය අත්තිකාරම් එම ගිණුම් වලට හර කිරීම වෙනුවට එකතු වටිනාකම රු.1,925,476 ක් කෙරීගෙන යන වැඩ ගිණුමට හර කිරීම හේතුවෙන් කෙරීගෙන යන වැඩ රු.1,925,476 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මුරවැසිහේන කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරිමේ වටිනාකම රු.7,314,810.80 ක් වූ අතර එය රු.9,240,287 ක් ලෙස "කෙරීගෙන යන වැඩ" ගිණුමට ගිණුම්ගත කර ඇත. ඒ අනුව, වැඩියෙන් ගිණුම්ගතවී ඇති රු.1,925,476 ක මුදල ජ'නල් සටහනක් මගින් නිවැරදි කර කර ඇත. | නිවැරදි ගිණුම් සටහන් තැබීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මොරගහකන්ද ව්‍යාපෘතියේ ගිණුම් අනුව ණයගැති හා ණයහිමි වටිනාකම් පිළිවෙලින් රු.108,452,464 ක් හා රු.907,550 ක් වුවද අධිකාරියේ ගිණුම්වල එම අගයන් පිළිවෙලින් රු.11,645,087 ක් හා රු.38,388,969,995 දක්වා තිබුණි. ඒ අනුව පිළිවෙලින් ණයගැති ශේෂය රු.10,737,537 ක් හා ණයහිමි ශේෂය රු.38,280,517,531 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද මෙකී වෙනස්කම් පිළිබඳ පරීක්ෂා කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | මොරගහකන්ද ව්‍යාපෘතිය මගින් ණයගැති ශේෂය ලෙස රු.108,452,464 ලෙස සනාථ කල ද එම ශේෂය තුළ 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ ණයගැති ශේෂය වන රු.38,564,344,510 ක මුදල ඇතුළත් කර නැත. මොරගහකන්ද ව්‍යාපෘතියේ ජංගම ගිණුම හා අධිකාරියේ ජංගම ගිණුම් අතර වෙනසට හේතුවී ඇත්තේ ව්‍යාපෘතිය විසින් කලාප /අංශ කාර්යාලවලට වත්කම් භෞතිකව ලබා දිමේ දී එම වත්කම්වල අදාළ කලාප /අංශ ජංගම ගිණුම් හරහා හුවමාරු නොවී ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුම හරහා පමණක් හුවමාරුවීමයි. ණයගැති ශේෂයේ වෙනසින් රු.690,000 ක් ද ණයහිමි ශේෂයේ රු.27,545,052 වටිනාකමක් ද හදුනාගෙන නිවැරදි කර ඇත. | ණයගැති හා ණයහිමි ශේෂ සසඳා වෙනස්කම් පවතී නම් පරීක්ෂා කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කළයුතුය. |

**1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 – 2018 කාලය තුළ රු.80,000,000 ක වියදමින් වැලිකන්ද සහ වැලිඔය කලාපවල ඉදිකර තිබුණු ජලපිරිපහදු යන්ත්‍රාගාර 30 ක් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව වියදම් ලෙස කපා හැර තිබුණි. එසේම ඒවායේ මෙහෙයුම් කටයුතු ගිවිසුම් මගින් අදාළ ගොවි සංවිධාන වෙත පැවරීමටද කටයුතු කර නොතිබුණි. | ගොවි සංවිධාන 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත මගින් නීතිගත කොට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් බලප්‍රදේශයන් තුල බලාත්මක කර ඇති නීත්‍යානුකූල ආයතනයකි.<br><br>එබැවින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරීන් මහවැලි බල ප්‍රදේශවල සුභසාධන කටයුතු සිදුකරන අවස්ථාවන්වලදී ගොවි සංවිධාන හා සම්බන්ධීකරණය කරමින් එම කටයුතු සිදු කිරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ. උක්ත යන්ත්‍ර මහවැලි ''බී'' හා ''එල්'' කලාපයන් තුළ ස්ථාපිත කිරීමේ දී ද ගොවි සංවිධානවල සහාය ලබාගැනීම සිදු කරන ලදි.<br><br>මෙම යන්ත්‍ර ක්‍රියාත්මක කොට පවත්වා ගෙන යාමේදී පුද්ගලයෙකු එම ස්ථානයේ රඳවා තැබීම අත්‍යාවශ්‍ය වන බැවින්, ගොවි සංවිධාන සමඟ සාකච්ඡා කොට ගොවි සංවිධානය හරහා පුද්ගලයෙක් එම යන්ත්‍රයේ කටයුතු පිළිබඳව පුහුණුවක් ලබා දී එහි රඳවා තැබීමට කටයුතු කරන ලදි. ඉදිරියේදී විධිමත්ව ගිවිසුමක් මගින් ගොවි සංවිධාන වෙත මෙම යන්ත්‍ර භාරදීම සඳහා මේ වනවිට කටයුතු කරමින් පවතී. | ප්‍රාග්ධන වියදම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළයුතුය. |

## 1.5.4 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණ | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් පාලනය හා නඩත්තුව කරගෙන යනු ලබන කලාප 6 ක කි.මී.9,237.9 ක් දිග ඇල මාර්ග රු. මිලියන 74,989 කට තක්සේරු කර මූල්‍ය ප්‍රකාශණවල දක්වා තිබුණද එම ඇල මාර්ග වෘත්තීය සුදුසුකම් සහිත පිළිගත් තක්සේරුකරුවෙකු හෝ තක්සේරු මණ්ඩලයක් මඟින් තක්සේරු කිරිමට කටයුතු කර නොතිබුණි. මෙම නිසා එම තක්සේරු වටිනාකම විගණනයේදී පිළිගත නොහැකි විය. | ප්‍රධාන වේලි, ජලාශ, වැව්, පාරවල් හා අදාළ ඇල මාර්ගවල වටිනාකම් තක්සේරු කිරීම සඳහා යොදවාගත් නිර්නායක ලෙස<br><br>කුඩා, මධ්‍යම සහ මහවැව් ඉදිකිරීම සඳහා භාවිතා කළ අමුද්‍රව්‍යවල ප්‍රමාණය පවතින ඒකක මිලෙන් ගුණ කිරීම, පාරවල්, ප්‍රධාන අතු බෙදුම් හා කෙත් ඇලවල් කිලෝමීටර 01 ක් ඉදිකිරීම සඳහා භාවිතා කළ අමුද්‍රව්‍යවල ප්‍රමාණය පවතින ඒකක මිලෙන් ගුණ කිරීම යොදා ගන්නා ලදී.<br><br>වටිනාකම් තක්සේරු කිරීම සඳහා අදාළ කලාප දැනුවත් කළ අතර, කලාප මඟින් ඉදිරිපත් කළ වටිනාකම් සාරාංශගත කරන ලදී. | වත්කම් වෘත්තීය සුදුසුකම් ලත් තක්සේරුකරුව කු හෝ තක්සේරු මණ්ඩලයක් මඟින් තක්සේරු කිරිමට කටයුතු කළයුතුය. |
| (ආ) | අධිකාරියේ පාලනය යටතේ පවතින වත්කම් ලෙස වැව් 463 ක් හා වේලි 11 ක් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණද එම වැව් හා වේලිවල අයිතිය මහවැලි අධිකාරිය සතුවේද යන්න තහවුරු කිරිමට අදාළ ලියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම එම වත්කම් අධිකාරියට අයත් වන බව තහවුරු කරගෙන තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | මහවැලි අධිකාරිය විසින් නඩත්තු කරන ප්‍රධාන වේලි 11 සහ වැව් 463 ක් භෞතිකව හදුනාගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මඟින් දක්වා තිබුණ ද රට තුළ පැවතුන කොරෝනා වසංගත රෝග තත්ත්වය මත එම වත්කම් තක්සේරු කර ගැනීමට නොහැකි වූ අතර 2022 වර්ෂයේ දී එම වත්කම් විධිමත් ලෙස තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් අධිකාරියට අයත් බව තහවුරු කරගෙන තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළයුතුය. |

## 1.5.5 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

| විගණන නිරීක්ෂණ | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්) සමාගම 2020 දෙසැම්බර් 30 දින සිට වාරිමාර්ග අමාත්‍යාංශය යටතට පවරා තිබීම හේතුවෙන් 2021 වර්ෂයට අදාළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළින් එම සමාගමේ වත්කම් හා වගකීම් අත්හැර තිබුණි. එසේ වුවත් මෙම පැවරීමට අදාළව සිදුකරන ලද ගිණුම් ගැලපීම් විස්තර | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරිමට කටයුතු කරමි. | පැවරීමට අදාළ ගිණුම් ගැලපීම් විස්තර විගණනයට ඉදිරිපත් කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා අදාළ පැවරීම් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමේ නිවැරදිතාවය විගණනයේදී සනාථ කරගත නොහැකි විය. | | |
| (ආ) | අධිකාරියට අයත් අනුබද්ධිත සමාගම් දෙකක් වන මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම 2012 වර්ෂයේදී ද, ස්වභාවික සම්පත් කළමනාකරණ පුද්ගලික සමාගම 2019 වර්ෂයේදී ද ඈවර කිරීම සඳහා තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ද ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික ) සමාගම හා ස්වභාවික සම්පත් කළමනාකරණ (පුද්ගලික) සමාගම යන පරිපාලිත සමාගම් ඈවර කිරීම සම්බන්ධ ඉදිරි කටයුතු මහා භාණ්ඩාගාරය හරහා ඉටු කර දෙන ලෙස ඉල්ලා ( 2021 මාර්තු 15 දින වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් මගින්) ලිපියක් යොමු කර තිබුණි. ඒ අනුව මහා භාණ්ඩාගාරයේ නීති කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021 දෙසැම්බර් 23 දිනැති ලිපිය ප්‍රකාරව මේ වන විට ඈවරකරු නම් කොට එම ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී. | ඈවර කිරීමට යෝජිත සමාගම් නොපමාව ඈවර කිරීමට පියවර ගතයුතුය. |
| (ඇ) | ව්‍යාපෘති කමිටුව විසින් තෝරා ගත් බාහිර ආයෝජකයකු සමඟ මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා 2018 සැප්තැම්බර් 18 දින අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව සමාගම විසින් කළමනාකරණය කරනු ලබන සී කලාපයේ ගිරාඳුරුකෝට්ටේ සහ බී කලාපයේ දම්මින්න ගොවිපළට අයත් අක්කර 1,154 ක වපසරියකින් යුත් භූමිය සියළු දේපළ ඇතුළත්ව රාජ්‍ය පෞද්ගලික කොටස් හිමි ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අභිලාෂයන් කැඳවීමට 2022 පෙබරවාරි 28 දින අධ්‍යක්ෂක මණ්ඩල අනුමතිය ලබාගෙන තිබුණි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී වර්ෂ තුනකට අධික කාලයක් ගතවී තිබුණ ද ඊට අදාල කටයුතු නිමකර නොතිබුණි. | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් මහවැලි පශු සම්පත් කෘෂි (පුද්ගලික) සමාගම විසින් කළමනාකරණය කරනු ලබන සී කලාපයේ ගිරාඳුරුකෝට්ටේ සහ බී කලාපයේ දම්මින්න ගොවිපල වලට අයත් අක්කර 1154 ක වපසරියකින් යුත් භූමිය සියළු දේපල ඇතුළත්ව රාජ්‍ය - පෞද්ගලික කොටස් හිමි ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා බාහිර ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා අභිලාශයන් කැඳවීමට අමප/21/2229/317/025-1 හා 2022 ජනවාරි 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව, 2022 පෙබරවාරි 01 දිනැති මාගේ සටහන පරිදි පුවත්පත් දැන්වීම් මගින් ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2022 පෙබරවාරි 28 දින ලබාගෙන ඇත.<br><br>ඒ අනුව, පුවත්පත් දැන්වීම් සකස් කර දිනමිණ, තිනකරන්, ඩෙලිනිවුස්, පුවත්පත් වල පලකිරීම සඳහා අවශ්‍ය විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය මේ වන විට අනුගමනය කරමින් සිටින අතර, ඒ සඳහා වන ඉල්ලීම වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී. | අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව කටයුතු කළයුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ණයගැති ණයහිමි කාල විශ්ලේෂණය අනුව වර්ෂ 05 ට වඩා වැඩි රු.242,525,000 ක ණයගැති ශේෂයක්ද, රු.85,844,000 ක ණයහිමි ශේෂයක්ද පැවතුණද, එම ශේෂයන් නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිරවුල් කිරිමට කටයුතු කිරිමට සටහන් කර ගතිමි. | ණයගැති ණයහිමි ශේෂ නිරවුල් කරගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 1646 | වාහනවල දෛනික ධාවන සටහන් අදාළ මාසයට පසු ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථමයෙන් විගණකාධිපති වෙත එවිය යුතු වුවද, අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ වාහන 57 ක දෛනික ධාවන සටහන් 2021 නොවැම්බර් 26 දින විගණනයෙන් ඉල්ලා සිටියද, වාර්තාවේ දිනය දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේ දී විමසුම මගින් දක්වා ඇති උපදෙස් අනුව කටයුතු කිරිමට සහ ඉල්ලුම් කරන ලද ධාවන සටහන් පත් ඉදිරිපත් කිරිමටත් කටයුතු කරමි | ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුය. |
| (ආ) | 1985 මැයි 10 දිනැති අංක 289 දරණ හා 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | රජයේ සියළුම වාහනවල රාජ්‍ය ලංඡනය සහ ආයතනයේ නම සඳහන් කළ යුතු වුවද අධිකාරියේ කිසිදු වාහනයක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ලාංඡනය සහ අධිකාරියේ නම අධිකාරියේ සියළු වාහනවල සඳහන් කිරිමට ඉදිරියේ දී කටයුතු කිරිමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛ නියමයන්ට අනුව වාහනවල රාජ්‍ය ලාංඡනය සහ ආයතනයේ නම සඳහන් කිරීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6.5.1 වගන්තිය | මූල්‍ය වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යවස්ථාපිත ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 25 දින අදාළ තොරතුරු සමග භාරදී ඇත. එම කාලපරිච්ඡේදය තුළ | මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව චක්‍රලේඛ |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | රටේ පැවති වාතාවරණය හේතුවෙන් (කොවිඩ් වසංගත තත්ත්වය) කලාප / අංශ වලින් කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ අන්තර්ගත විය යුතු තොරතුරු ලබා දිමේ දී කාලපමාවක් සිදු වු බැවින් මුල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරිමට නොහැකි වී ඇත. | නියමයන්ට අනුව විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | (i) 3.1 වගන්තිය | නිල වාහන හිමි එච්එම් 1-1 ශ්‍රේණිය යටතට වැටෙන අධ්‍යක්ෂවරුන්ට අනුමත මාසික ඉන්ධන දීමනාව ලීටර 120 ක් වුවත් ඊට පටහැනිව ලීටර 140 ක් ගෙවීම් කිරීම නිසා 2018, 2019, 2020 සහ 2021 වර්ෂවල ප්‍රධාන කාර්යාලය විසින් රු.1,173,213 ක වැඩිපුර මුදලක් ගෙවා තිබුණි. | නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් ගත්විට අතිරේක දිසාපති වශයෙන් ද කටයුතු කිරිමට නෛතික විධිවිධාන සැලසී ඇත. එසේ ගත් විට මෙම නිලධාරියා ප්‍රධාන මෙහෙයුම් නිලධාරින් වශයෙන් රාජකාරි කරන බැවින්ද සියලු කලාපවල ඒ ඒ විෂය ගත කරුණු ඒ ඒ විෂය ගත අධ්‍යක්ෂවරු හරහා සිදුවන බැවින් මෙම නිලධාරින් උක්ත චක්‍රලේඛයේ දක්වා ඇති '' ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා'' ගේ රාජකාරි භූමිකාව සිදුකරන බැවින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියලු නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් හා අධ්‍යක්ෂවරුන් ප්‍රධාන මෙහෙයුම් නිලධාරින් සේ සලකා 2015/01 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛණයේ සඳහන් පරිදි ඉන්ධන ලීටර් 140 බැගින් ලබා දී ඇත. | චක්‍රලේඛ නියමයන්ට අනුව ඉහත දීමනා ගෙවීමට කටයුතු කළයුතු අතර වැඩියෙන් ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| | (ii) 3.2 වගන්තිය | රාජකාරී කටයුතු ඉටුකිරීම සඳහා මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ දරන ලද සත්‍ය ඉන්ධන වියදම් ප්‍රතිපූරණය කළහැකි වූවත්, සේවා ස්ථානයෙන් බැහැර | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 37 වන විධායක කළමනාකරණ කමිටු රැස්වීමේ තිරණය අනුව අතිරේකව ලබා ගන්නා ඉන්ධන සඳහා ගෙවීම් කර ඇත.<br><br>කෙසේ වෙතත් රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 2015/01 අනුව අමතර ලබා ගන්නා ඉන්ධන | චක්‍රලේඛ නියමයන්ට අනුව ඉහත දීමනා ගෙවීමට කටයුතු කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රාජකාරී සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව නිල වාහන සඳහා අතිරේක ඉන්ධන ලබා දී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලයේ නිල වාහන හිමි නිලධාරීන්ට අනුමැතියකින් තොරව රු.1,657,505 ක අතිරේක ඉන්ධන වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. | සඳහා ගෙවීම් කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රවාහන) දැනුවත් කර ඇත. | |
| | (iii) 3.6 වගන්තිය | නිල වාහන හිමි නිලධාරීන්ට සේවා ස්ථානයේ සිට කිලෝමීටර් 40 ට වඩා දුර විශේෂ රාජකාරී කටයුතු සඳහා කණ්ඩායම් වශයෙන් සහභාගීවීමට කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සපයා දිය හැකි වුවත් අධිකාරිය විසින් එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | අධිකාරිය තුළ අංශ කිහිපයක් පවතී. එම අංශයන්වල නිලධාරින් සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් හැකිතාත් දුරට ලබා දීමට කටයුතු කර ඇත. එක් එක් අංශවල විවිධ ක්ෂේත්‍ර රාජකාරි කටයුතු යෙදෙන අවස්ථාවන් හිදී පවතින සීමිත වාහන සංඛ්‍යාව තුළ කළමනාකරණය කර කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සලසා දුන්නද ඒ පිළිබඳව ප්‍රයෝගික ගැටළු මතුවී ඇත. | චක්‍රලේඛ නියමයන්ට අනුව කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සපයාදීමට කටයුතු කළයුතුය. |
| (ඉ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12 වගන්තිය | සෑම වර්ෂයකට වරක්ම වාහන අපහරණ ක්‍රියාවලිය සිදු කළයුතු වුවත් අධිකාරිය විසින් 2016 වර්ෂයෙන් පසු වාහන අපහරණයක් සිදුකර නොතිබුණි. | අපහරණය කිරීමට නිර්දේශිත වාහන මුලිකවම කලාප/ අංශ මට්ටමින් හඳුනාගැනිමෙන් පසුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරික්ෂකවරයෙකු අන්තර්ගත අභ්‍යන්තර කමිටුවක් විසින් සියළු කලාප/අංශවල ක්ෂේත්‍රයට ගොස් භෞතිකව පරික්ෂා කර ලබාගත් තක්සේරු වාර්තාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුමැති සඳහා මේ වන විට යොමු කර ඇත. | චක්‍රලේඛ නියමයන්ට අනුව වාහන අපහරණය සිදුකිරීමට කටයුතු කළයුතුය. |
| (ඊ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |
| | (i) 3.1 වගන්තිය | රජයේ වාහන සඳහා සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් | මගේ අංක MASL/HO/TR/ADM/106 හා 2022 පෙබරවාරි 09 දිනැති ලිපිය | චක්‍රලේඛ නියමයන්ට අනුව |

| | | | | |
|---|---|---|---|---|
| | | පසුව හෝ කි.මී 25,000 ක දුර ධාවනයෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් අධිකාරිය විසින් සිය වාහන සම්බන්ධයෙන් එවැනි ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | මගින් ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරික්ෂාවක් කරන ලෙස ප්‍රධාන කාර්යාලය ඇතුළුව සියලු කලාප/අංශ දැනුවත් කර ඇත. | වාහනවල ඉන්ධන පරික්ෂාවන් සිදුකළයුතුය |
| | (ii) 4.2 හා 4.3 වගන්ති | වාහනවල බාහිර අළුත්වැඩියාවන් සඳහා මිල ගණන් කැඳවිය යුතු වුවත් අභ්‍යන්තර අළුත්වැඩියාවන් සඳහා එසේ ක්‍රියාකිරීමට හැකියාවක් නොමැති හෙයින් කොටස් ගලවන ලද ගරාජයේ මිල ගණන් පිළිගැනීමට සිදු වන අතර එම මිල ගණන් සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තුවක සංස්ථාවක හෝ මණ්ඩලයක සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබාගත යුතු වුවද අධිකාරිය විසින් එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | රාජකාරි කටයුත්තක් අතරතුරේ දී සිදුවන ආපදාවකදී පවතින තත්ත්වය මත සිදුව ඇති දෝෂ නිසි පරිදි අලුත්වැඩියා කර ඒ සඳහා ආවරණ අනුමැතිය ගනු ලැබේ.<br><br>නමුත් සියලුම වාහන අලුත්වැඩියා කිරීම ආයතනයේ පවතින ප්‍රසම්පාදන පිළිවෙතට අනුකූලව කරන බවද යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේද නිරීක්ෂණ ඇතුළත් වාර්තාවක් යොමු කිරිමට කටයුතු කරමි. | චක්‍රලේඛ නියමයන්ට අනුව වාහන අලුත්වැඩියාව සම්බන්ධ යෙන් කටයුතු කළයුතුය. |
| (උ) | 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 05/2020 දරන මුදල් අමාත්‍යාංශයේ වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 02 (අ) වගන්තිය | ධාවන තත්ත්වයේ නොපවතින වාහන 2020 දෙසැම්බර් 31 දිනට අපහරණය කළයුතු වුවත් අපහරණය කළයුතු යැයි හඳුනාගෙන තිබුණු වාහන 120 ක් 2022 අප්‍රේල් 27 විගණිත දිනය දක්වා අපහරණය කර නොතිබුණි. | 2015 ජූලි 10 දිනැති අංක 02/215 දරන රාජ්‍ය ආයතනවල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීම යන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව කටයුතු සිදු කර ඒ සඳහා ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගැනිමට යොමු කර ඇත. | චක්‍රලේඛ නියමන්ට අනුව වාහන අපරහණය සිදුකළයුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2002 වර්ෂයේදී ණය ලබාදීමට චක්‍රීය අරමුදලක් ඇති කිරීමට රු.මිලියන 48 ක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තැන්පත් කර තිබුණද, 2010 වර්ෂයෙන් පසුව එම ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමකින් තොරව සියයට 4 ක අඩු පොලී අනුපාතිකයක් යටතේ බැංකුවේ රඳවාගෙන තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට පොලිය සමඟ එම අරමුදල රු.93,783,845 ක් වී තිබුණු අතර, 2021 අප්‍රේල් මස ඉන් රු.81,162,538 ක මුදලක් අයකරගෙන තිබූ අතර, රු.12,621,307 ක මුදලක් හා ඊට අදාළ පොලිය තවදුරටත් අයකර ගතයුතුව පැවතුණි. | මෙම තැන්පතු මුදල් කඩිනමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නිදහස් කිරීමට කටයුතු කරන ලෙස දන්වමින් සභාපති, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත දැනුම් දී ඇත. එම දැනුම්දීම්වල ප්‍රතිඵලයක් වශයෙන් අධිකාරිය වෙත නිදහස් කළද තවදුරටත් හිඟ මුදල කඩිනමින් පියවන ලෙසට ලිපියක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත යොමුකර ඇති අතර මෙම මුදල කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී. | තවදුරටත් අයකර ගැනීමට පවතින මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.665,334,000 ක ලාභයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.588,403,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,253,737,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රාජ්‍ය භාග ආදායම් වැඩිවීම, ගොවිපල විකුණුම් හා අනෙකුත් ආදායම් වැඩිවීම සහ රජයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන ප්‍රතිපාදන ලැබීම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුළ වැව් අමුණු හා කෘෂි ඇල මාර්ග පිළිසකර කිරීමේ ජාතික වැඩසටහන යටතේ ප්‍රමුඛතාවය මත වැව් 37 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහාත් වැව් 66 ක් ගාස්තු අයකර රොන්මඩ ඉවත් කිරීමටත් සැලසුම් කර තිබුණි. වැව් පද්ධතිය ආරක්ෂා කිරීමට නම් මෙම වැඩසටහන හරහා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී තනි තනිව වැව් තෝරා නොගෙන එල්ලාංග පද්ධති වශයෙන් තෝරා ගෙන ඒවායේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම වඩා යෝග්‍ය බව විශේෂඥයින්ගේ මතය වූවත්, ඊ හා බී | බී කලාපයේ වැව් 11ක සහ ඊ කලාපයේ වැව් 12 ක ප්‍රතිසංස්කරණ කටයුතු වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ 2021 වසර තුළ දී සිදුකළ අතර, පිළිවෙලින් සියයට 71 ක හා සියයට 68 ක භෞතික ප්‍රගතියක් 2021 වසර තුළ ලඟා කරගෙන තිබුණි.<br><br>රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රොන්මඩ ඉවත්කර ගැනිමේ කාර්යය සඳහා අනුමැතීන් ලබාගැනීමට අධික කාලයක් ගත වූ බැවින් මෙම | වැඩසටහනෙහි අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | කලාපවලට අයත් වැව් 11 ක් එල්ලාංග පද්ධතිවලට අයත් වූවද, එම වැව් පිළිසකර කිරීමට තෝරාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසානයට ප්‍රතිසංස්කරණය කිරීමට තෝරාගත් වැව් 18 ක භෞතික ප්‍රගතිය සියයට 50 කටත් වඩා අඩු මට්ටමක පැවතුණු අතර ගාස්තු අයකර රොන්මඩ ඉවත් කරන ලද වැව් ගණන 05 ක් පමණක් විය. එසේම රොන්මඩ ඉවත් කිරීම තුළින් රු.මි. 598.7 ක ආදායමක් උපයා ගැනීමට අපේක්ෂා කර තිබුණද, රු.මි. 9.45 ක් පමණක් උපයාගෙන තිබුණි. | අපේක්ෂිත ප්‍රගතිය ලබා කර ගැනීමට නොහැකි විය.<br><br>තවද වැව් යටතේ ඇති කුඹුරු සඳහා ජලය නිකුත් කිරීමට බාධාවක් නොවන සේ රොන්මඩ ඉවත් කිරීමේ කාර්ය සිදු කළයුතු බැවින්, අපේක්ෂිත මූල්‍ය ප්‍රගතියක් හෝ භෞතික ප්‍රගතියක් ලබා කර ගැනීමට නොහැකි විය. | |
| (ආ) | ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 1/3 ක් පමණ මහවැලි බලප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර, එම ප්‍රදේශයට අයත් රජයේ ඉඩම් කළමනාකරණය අධිකාරිය සිදුකරන අතර, එය වඩා කාර්යක්ෂම කිරීම තුළින් ජනපදිකයින් හා ආයෝජකයන් වෙත ප්‍රශස්ත සේවාවක් ලබාදීම අරමුණු කර ගනිමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ඉඩම් කළමනාකරණයට හඳුන්වාදීම සඳහා අධිකාරිය විසින් 2016 හා 2018 වර්ෂවලදී රු.6,973,405 ක මුදලක් පෞද්ගලික ආයතන 03 ක් වෙත අවස්ථා තුනකදී ගෙවීම් කර තිබුණු අතර, පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් 60 ක් පුහුණු කිරීමටද කටයුතු කර තිබුණි. නමුත් වර්තමානය වනවිටද ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක නොවීම නිසා එම වියදම නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි. | රජයේ ඉඩම් කළමණාකරණ පද්ධතිය (E-Slims) සංවර්ධනය, මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සඳහා පෞද්ගලික සමාගමක් සමග සේවා ගිවිසුමකට එළඹීමට කටයුතු කර තිබුණි.<br><br>ඉඩම් කොටස් 23,210 ප්‍රමාණයක තොරතුරු ඇතුළත් කිරීම මූලික පියවර ලෙස ආරම්භ කරන ලදී. දීර්ඝකාලීන බදුකර/වාර්ෂික අවසරපත්‍ර/ ප්‍රදාන පත්‍ර /අවසර පත්‍ර 5416 කට අදාළ මූලික තොරතුරු පද්ධතියට ඇතුළත් කිරීමට මේවන විටත් කටයුතු කර ඇත.<br><br>නමුත් පවතින මූල්‍ය තත්වය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළව මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති බව දන්වමි. | ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | විගණනය වෙත ලබාදුන් තොරතුරු අනුව අධිකාරිය විසින් ආයෝජන ව්‍යාපෘති සඳහා ආයෝජකයින් 695 දෙනෙකු වෙත හෙක්ටයාර 6,879 ක් මුළු ඉඩම් ප්‍රමාණයක් ලබාදී තිබුණි. ඉන් පූර්ණ වශයෙන් සංවර්ධනය කර ඇති ඉඩම් කට්ටි ප්‍රමාණය හෙක්ටයාර 3,284 ක් වූ අතර ඌන සංවර්ධිත ඉඩම් කට්ටි ප්‍රමාණය හෙක්ටයාර 2,023 ක් ද, අසංවර්ධිත ඉඩම් කට්ටි ප්‍රමාණය හෙක්ටයාර 1,572 ක් ද වශයෙන් පැවතුණි. මේ අනුව ලබාදුන් ඉඩම් ප්‍රමාණයෙන් 52%ක් ඌන සංවර්ධිත හා අසංවර්ධිත ඉඩම් වශයෙන් | වැඩිම ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාවක් පවතින මහවැලි බී කලාපයේ ආයෝජන ව්‍යාපෘති සඳහා වෙන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්.1285ක් වන ඉඩම් කට්ටි 128ක් අවලංගු කිරීමට කටයුතු කර ඇත.<br><br>අනෙකුත් අවලංගු කර ඇති ඉඩම් සඳහා විධිමත් ආයෝජකයින් ගේ ශක්‍යතාවය පරීක්ෂාකර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | ඉඩම් ලබාදීමේ පරමාර්ථ ඉටුකර ගතහැකි පරිදි ඉඩම් සංවර්ධනය කිරීම පිළිබඳ පසුවිපරම් කළයුතු අතර, සංවර්ධනය නොකරන ඉඩම් නැවත පවරාගෙන සුදුසු කාර්යයන් සඳහා භාවිතා කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | පැවතුණු අතර එම ඉඩම් නැවත පවරාගෙන වෙනත් ආයෝජකයින්ට ලබාදීමට කටයුතු කර නොතිබුණි. | | හිඟ බදු අයකර ගැනීමට අවශ්‍ය පියවර ගතයුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබුණු වාහනයක් අස්ථානගතවී ඇති බැව් සඳහන් කරමින් 2021 ජුලි 01 දින කොළඹ වංචා හා විමර්ෂණ කාර්යාලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. උක්ත වාහනය අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයක් වෙත ලබාදී ඇති බවත්, එම වාහනයේ පැවැත්ම පිළිබඳව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණවලින් තහවුරු කර නොතිබුණු බවත් සඳහන් කරමින් 2018 ජනවාරි 09 දින විගණන විමසුමක් මඟින් දන්වා තිබුණද, ඒ සම්බන්ධයෙන් නිසි අවධානය යොමුකර නොතිබුණු අතර, ආයතනික මට්ටමින් කිසිදු පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. | මේ සම්බන්ධව පරීක්ෂණ, පොලිස් වංචා විමර්ශන අංශය විසින් කරගෙන යනු ලබන අතර විමර්ශනවල වර්තමාන තත්ත්වය පිළිබඳව වාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. | වාහන කළමනාකරණ කටයුතු විධිමත්ව සිදු කළයුතුය. |
| (ඉ) | අධිකාරිය සතු පැල තවාන් 11 කින් පැල තවාන් 08 ක් ම අලාභ ලබා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අලාභය රු.35,077,470 ක් විය. | පැලයක් නිෂ්පාදනය කිරීම හා විකිණීම තෙක් නඩත්තු කිරීම සඳහා වියදම් වන මුදල් ප්‍රමාණය වර්තමානය වනවිට වැඩිවී ඇති නමුත්, එයට සමගාමීව පැලවල මිල සංශෝධනයක්වී නොමැත. | පැල තවාන් නිසි කළමනාකරණය කින් පවත්වාගෙන ලාභ ලබා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඊ) | මිරිදිය මත්ස්‍ය වගාව සඳහා අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් අවශ්‍යතාවය කලාපය තුළම නිෂ්පාදනය කරගැනීම සඳහා වූ 2019 – 2023 කාලයට අදාළ පස් අවුරුදු සැලැස්ම තුළ එල් කලාපයේ ජලාශ 10 ක 2021 වර්ෂය තුළ මත්ස්‍ය ඇඟිල්ලන් 2,164,000 ක් තැන්පත් කිරීමට ඉලක්ක කර තිබුණද, සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම තුළින් මෙ. ටොන් 500ක මත්ස්‍ය අස්වැන්නක ඉලක්කයක් වෙනුවෙන් මත්ස්‍ය ඇඟිල්ලන් 400,000ක් මුදාහැරීම සඳහා රු.1,300,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. වර්ෂය අවසාන වනවිට මත්ස්‍ය ඇඟිල්ලන් 60,000 ක් පමණක් තැන්පත් කර තිබුණි. තවද, මත්ස්‍ය ඇඟිල්ලන් හා කීට ඉස්සන් මිලදී ගැනීම වෙනුවෙන් | 2021 වර්ෂයේ මහවැලි අධිකාරියේ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේදී මහවැලි එල් කලාපය සඳහා මෙ.ටො. 500 ක මත්ස්‍ය අස්වැන්නක ඉලක්කයක් ලබා දී ඇත. කලාපයේ ජලාශවල ජලය සිඳීයාම සහ අවශ්‍ය අවස්ථාවේදී මත්ස්‍ය ඇඟිල්ලන් සැපයීමට ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට නොහැකි වූ නිසා 2021 වසර තුළ ඉතිරි මත්ස්‍ය ඇඟිල්ලන් 360,000 මුදා හැරීමට නොහැකි විය. නමුත් මෝසම් වර්ෂාවත් සමග ජලාශ පිරීයාමත් සමග 2022 වසරේ පළමු මාසය තුළ අදාළ මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම කර ඇත. කීට ඉස්සන් ප්‍රමාණවත් තොග අදාළ ආයතන සතුව නොපවතින | වැඩ සටහන තුළින් අපේක්ෂිත අරමුණු ලබාකර ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.1,300,000 ක අත්තිකාරම් ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණද, රු.300,000 ක අත්තිකාරම් 2022 ජුනි 20 වන විටත් පියවා නොතිබුණු අතර, ඇහැටුගස්වැව පිහිටුවීමට සැලසුම් කර තිබුණු අභිජනන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතුද ආරම්භ කර නොතිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ අපේක්ෂිත මත්ස්‍ය අස්වැන්න මෙ. ටොන් 500 වුවත් සමාලෝචිත වර්ෂයේ අවසානයට මත්ස්‍ය අස්වැන්න මෙ.ටොන් 99.3 ක් පමණක් විය. | බැවින් රු.300,000 කට අදාළ කීට ඉස්සන් තොගය ඉදිරි සති දෙක තුළදී ලබා දෙන බව දැනුම් දී ඇත. | |
| (උ) | වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් 2017 වර්ෂයේදී අධිකාරිය වෙත ලැබී දෙහිඅත්තකන්ඩිය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබුණු වාහනයක් මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාගේ උපදේශකගේ කටයුතු වෙනුවෙන් මැදිරිගිරිය කලාපයේ රියදුරකු වෙත ලබාදී තිබුණු අතර, 2019 දෙසැම්බර් 22 දින එම වාහනය අනතුරට ලක්වී තිබුණි. මුදල් රෙගුලාසි 104(4) අනුව අලාභහානිය සිදුවූ දිනයේ සිට මාස 03 ක් ඇතුළදී හානි සම්බන්ධ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවත් අනතුර සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් මු.රෙ.104 (4) ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබුණි. වාහනයට සිදුවූ රු.6,915,484 ක අලාභයෙන් රු.2,500,000 ක් පමණක් රක්ෂණ ආයතනයෙන් අයකරගෙන තිබුණු අතර, ඉතිරි අලාභය වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකරගෙන නොතිබුණි. | වාහනයට සිදුවී ඇති අලාභයෙන් රක්ෂණ ආයතනයෙන් ආවරණය නොවන මුදලක් වේ නම් එම මුදල අදාළ වගකිවයුතු නිලධාරියා විසින් ගෙවීමට ලිඛිතව කැමැත්ත ප්‍රකාශ කර ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාළ වගකිවයුතු පාර්ශව වෙතින් එය අයකර ගැනීමට පියවර ගතයුතුය. |
| (ඌ) | අධිකාරියට අයත් ගබඩා 43 ක් 2009 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබුවද, එම ගබඩා වෙනුවෙන් කිසිදු කුලී මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිටත් අයකර ගෙන නොතිබුණි. එම ගබඩා වී ගබඩා කිරීමට ප්‍රමිතගත පරිදි අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවය මත ගබඩාවල අයිතිය වී අලෙවි මණ්ඩලය වෙත පවරා දෙනමෙන් වී අලෙවි මණ්ඩලයේ සභාපති විසින් මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් කරන ලද ඉල්ලීමට අනුව | වී අලෙවි මණ්ඩලය විසින් භාවිතා කරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ගබඩා ගොඩනැගිලි සඳහා කුලී ගෙවීමේ හැකියාවක් නොමැති බැවින්, අදාළ ගබඩා වී අලෙවි මණ්ඩලය වෙත පවරා දෙන ලෙසත් ඉල්ලුම් කර ඇත.<br><br>රජයේ ඉඩම් ආඥා පනත අනුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩමක් මණ්ඩලයකට නොමිලේ පවරාදීම සඳහා ප්‍රතිපාදන නොමැත. එබැවින් | ගබඩා කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළයුතු අතර, අදාළ කුලී මුදල් අයකර ගතයුතුය. |

| | |
|---|---|
| අදාළ පැවරීම් කටයුතු සිදුකිරීමට එම ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ලබාගැනීමට කටයුතු සිදුකෙරෙමින් පවතින බව පසුගිය වර්ෂයේ දී විගණනයට දන්වා තිබුණි. එසේ වුවද 2022 ජුනි 20 දින විගණනයට ලබාදුන් තොරතුරු අනුව රජයේ ඉඩම් ආඥා පනත අනුව අධිකාරිය සතු ඉඩමක් මණ්ඩලයකට නොමිලේ පවරා දීමට ප්‍රතිපාදන නොමැති බැවින් කුලී අයකර ගැනීම හෝ පවරා දීම සම්බන්ධ ගැටළුව මෙතෙක් විසඳාගත නොහැකි වූ බව දන්වා තිබුණි. | ඉඩම් රජයේ තක්සේරුවෙන් සියයට 4 ක වටිනාකමක් අයකර ගැනීම මත පදනම්ව දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීම හෝ අභ්‍යන්තර චක්‍රලේඛ ප්‍රකාරව කුලී පදනම මත ලබා දීම පමණක් සිදුකළ හැකිය.<br>මෙම ගැටලුව රේඛීය අමාත්‍යාංශවල ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් කැඳවා ඉදිරි කටයුතු සම්බන්ධ සාකච්ඡා කිරීමට තීරණය කර ඇත. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය සතු සංචාරක බංගලා සංඛ්‍යාව 27 ක් වන අතර, එම සංචාරක බංගලා 27 ම ආදායම ඉක්මවා වියදම් දරා තිබීම හේතුවෙන් රු.36,385,684 ක අලාභයක් සමාලෝචිත වර්ෂය තුළ දරා තිබුණි. සංචාරක බංගලා ආදායම අඩුවෙමින් පැවතියදීත් 2021 වර්ෂයේ සිට මේ දක්වා අධ්‍යක්ෂ (ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම්) කාර්යාලය යටතේ පවත්නා සංචාරක බංගලා 05 ම අන්තර්ජාල පහසුකම් මඟින් වෙන් කිරීම හා බාහිර පුද්ගලයින් වෙත නිකුත් කිරීම නවතා දමා තිබුණු බව නිරීක්ෂණය වූ අතර සේවා අවශ්‍යතාවය වෙනුවෙන් සංචාරකයින් වෙත බැහැර කිරීම තාවකාලිකව අත්හිටුවා ඇති බව විගණනයට දන්වා තිබුණි. | මහවැලි අධිකාරිය සතු සංචාරක බංගලා 2017 වර්ෂයට පෙර දී වාර්ෂික රු.මි. 1.5 ක සාමාන්‍ය ආදායමක් උපයමින් පැවති අතර, මහවැලි සංචාරක බංගලා නවීකරණය කරමින් අන්තර්ජාල ගත කිරීමේ ව්‍යාපෘතිය තුළ සාමාන්‍ය ආදායම රු.මි.10 ඉක්මවා ගැනීමට හැකිවිය.<br><br>තවද 2020 වර්ෂයේ සිට මේ දක්වා පවතින ලෝක වසංගත තත්වය තුළ දේශීය හා විදේශීය සංචාරක ව්‍යාපාරය විශාල පසුබෑමකට ලක් වූ අතර එම තත්වය තුළ අපේක්ෂිත ඉලක්කය වෙත ළඟා වීමට නොහැකි විය.<br>එමෙන්ම මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ (ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම්) යටතේ සංචාරක බංගලා 05 ක් පවතී. එම සංචාරක බංගලා වේලි ආශ්‍රිතව පිහිටා ඇති බැවින් අධ්‍යක්ෂ (ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම්) විසින් සිදු කරන ලද ඉල්ලීමට අදාළව සේවා අවශ්‍යතාවය වෙනුවෙන් සංචාරකයින් වෙත බැහැරකිරීම තාවකාලිකව අත්හිටුවා ඇත. | සංචාරක බංගලා ආදායම වැඩි කර ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රධාන කාර්යාලය විසින් රු.5,160,000 ක ප්‍රතිපාදනයක් යටතේ Intel-3, Intel-5, Intel-7 පරිගණක යන්ත්‍ර 25 ක් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද, රු.7,719,450 ක් වැයකර පරිගණක යන්ත්‍ර 54 ක් මිලදී ගෙන | 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රධාන කාර්යාලයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් වර්ෂයේ ආරම්භයේ දී රු.මි.17 ප්‍රතිපාදන වෙන් කර තිබුණි. නමුත් වරින් වර වාර්ෂික | අනුමත ප්‍රසම්පාදන සැලසුම ප්‍රකාරව කටයුතු කළයුතු අතර, සංශෝධිත ප්‍රසම්පාදන |

| | | |
|---|---|---|
| තිබුණි. තවද, රු.7,390,000 ක ප්‍රතිපාදනයක් යටතේ Intel-5, Intel-7 ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 45 ක් මිලදී ගැනීමට සැලසුම්කර තිබුණද, ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 61 ක් රු.14,690,658 කට මිලදී ගෙන තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් ප්‍රතිපාදන ඉක්මවා රු.9,800,000 ක් වැයකර තිබුණි. | සැලැස්ම සංශෝධනය විමත් සමඟ රු. මි.33 ක මුදල් ප්‍රතිපාදන ප්‍රධාන කාර්යාලය සහ කලාප කාර්යාල සඳහා ඉල්ලීම් කර ඇති ඩෙක්ස්ටොප් පරිගණකය හා ලැප්ටොප් පරිගණකය හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා වෙන් කරන ලදී.<br>ඒ අනුව වර්ෂයේ දී ප්‍රසම්පාදන සැලැස්ම රු. මි.17 ප්‍රමාණයට අනුමත කර ඇති නමුත් සංශෝධිත සැලැස්මට අනුව ඉහත මිල දී ගැනිම් සිදුකර ඇති බව දන්වා සිටිමි. | සැලසුම් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 34 ක් පැවතුණු අතර, ඉන් තනතුරු 15 ක් පුරප්පාඩුව පැවතුණි. තනතුරු 14 ක් වැඩබැලීම, රාජකාරී ආවරණය, කොන්ත්‍රාත් පදනම හා ද්විතීයන පදනම මත රාජකාරී ඉටුකරනු ලබන අතර, එම තනතුරු ස්ථිරව පිරවීමට කටයුතු කර නොතිබුණි. තවද, මධ්‍යම කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 79 ක් ද, මෙහෙයුම් කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 730 ක් ද පැවතුණි. අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා ස්ථිරව බඳවාගත් නිලධාරීන් 68 ක් ද, අනුමත කාර්යය මණ්ඩලය තුළ ඇතුළත් නොවුණු කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සම්බන්ධීකාරක තනතුරු 33 ක් හා මාධ්‍ය උපදේශක තනතුරක් ද ඇතුළුව අතිරික්ත නිලධාරීන් 102 ක් විය. අනුමත කාර්යය මණ්ඩලය තුළ ඇතුළත් නොවුණු කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සම්බන්ධීකාරක තනතුරු 33 ක් හා මාධ්‍ය උපදේශක තනතුර සඳහා පිළිවෙලින් රු.2,469,641 ක් හා රු.832,792 ක් වැටුප් හා දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. | අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ගේ “රාජ්‍ය වියදම් සමාලෝචනය” යන අමාත්‍ය මණ්ඩල තීරණයේ හා ඒ සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමා 2021 අගෝස්තු 28 දින ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව දන්වා ඇති පරිදි බඳවා ගැනීම් සිදු කිරීම කල් දැමීම මත පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ හැකියාවක් නොමැති බැවින් වැඩ බැලීම, රාජකාරී ආවරණය, කොන්ත්‍රාත් කාර්යය පැවරුම් පදනම මත හා ද්විතීයන පදනම මත රාජකාරි ඉටුකරවා ගෙන ඇත.<br>නව බඳවා ගැනීම් පරිපාටිය මත තනතුරු අඩුවීම මත සේවක අතිරික්තයක් වී ඇත.<br>තවද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 25/2014 හා 25/2014 (I) අනුව අඛණ්ඩව දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින්ට ස්ථිර පත්වීම් ලබා දෙන ලදි.<br>මහවැලි ගොවි ජනතාවගේ කෘෂිකර්ම හා සත්ව පාලනය සම්බන්ධ තාක්ෂණික දැනුම වැඩි දියුණු කිරීමේත්, විශ්ව විද්‍යාලය සතු දැනුම ගොවින් වෙත සෘජුව ගෙනයාමේත් සම්බන්ධීකරණ කටයුතු කොට්ඨාශ මට්ටමින් සිදු කිරීමට කොන්ත්‍රාත් පදනම මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මගින් සම්බන්ධීකාරක තනතුර සඳහා බඳවා ගැනීම් සිදු කර ඇත.<br>මාධ්‍ය ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහ අත්දැකීම් සහිත නිලධාරියකු “මාධ්‍ය උපදේශක” තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මගින් බඳවා ගෙන ඇත. | අනුමත සේවක සංඛ්‍යාව අවශ්‍ය පරිදි සංශෝධනය කරගත යුතු අතර, අනුමත තනතුරු සඳහා අදාළ නිලධාරීන් සේවා නියුක්ත කළයුතුය. |